WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

40 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

සංගීතය (පෙරදිග) I, II
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) යමන් රාගයට අයත්වන නි̣රිස, නි̣රිගරිස යන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර ලියන්න.

(ii) භූපාලි රාගය පිළිබඳ සැලකීමේ දී මධ්‍යමය හා නිෂාදය යන ස්වර දෙක හැඳින්විය හැක්කේ කුමන නමකින් ද?

(iii) ඛ්‍යාල් ගීත ආකෘතියක ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

(iv) තාලයක එක් ආවර්තයකට අයත් අවනද්ධාක්ෂර ප්‍රබන්ධය හඳුන්වනුයේ කුමන නමකින් ද?

- අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) උකුසා වන්නමේ නාදමාලාව ආශ්‍රිතව ...................... යනුවෙන් ඇරඹෙන සරල ගීය නිර්මාණය වී ඇත.

(vi) 'හෙළ ගී මග' නම් ග්‍රන්ථයෙහි කතුවරයා වන්නේ .................................... සූරීන් ය.

(vii) විද්‍යුත් සංගීතය සංධ්වනි (Symphony) වාද්‍ය වෘන්දය සමග මුසුකර නව ආරක ජනප්‍රිය සංගීතයක් නිර්මාණය කළ අපරදිග සංගීතඥයකු ලෙස .................................................... හැඳින්විය හැකි වේ.

(viii) අන්දරේලා නාට්‍යයෙහි එන 'රස බොජුනක් නැතත් තුන්වේලම කන්ට' නමැති ගීතය ගායනා කරන්නේ අන්දරේ සහ ........................................... ය.

- පහත වගුවේ අංක (ix) සහ (x) ප්‍රශ්නවලට සුදුසුම පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(කුස පබාවතී, ඔස්ටින් මුණසිංහ සූරීන්, ලයනල් අල්ගම සූරීන්, රතු හැට්ටකාරි)

| නව නාට්‍ය ගීත | නව නාට්‍යයේ නම | සංගීත අධ්‍යක්ෂණය |
|---|---|---|
| (ix) රතදර සිරි පරදන නිමල කොමල සෝබමාන රූප විලාසේ | ................................ | ................................ |
| (x) යස ඉසුරු පිරුණු තැනා | ................................ | ................................ |

**2.** පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩ කිහිපයකි.

(A) මපගු, රිගු, රිමගුරිස

(B) ගමරි, ගප, මගමරිස

(C) නි̣රිග, පරි, නි̣ධ̣, නි̣රිස

(i) ඉහත දැක්වෙන (A), (B), (C) යන ස්වර ඛණ්ඩවලට අයත් වන රාග පිළිවෙලින් නම් කරන්න.

(ii) (B) හා (C) රාගවලට අයත් තොරතුරු ඇතුළත් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| රාගයේ නම | ආරෝහණ | අවරෝහණ | වාදී, සංවාදී |
|---|---|---|---|
| (B) ...................... | ...................... | ...................... | ...................... |
| (C) ...................... | ...................... | ...................... | ...................... |

(iii) (A) හෝ (C) රාග දෙකින් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ අන්තරා කොටසක් තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න.

(iv) නිර්දේශිත ඕනෑම රාගයකට අදාළ ව මාත්‍රා අටකට නොඅඩු වන සේ තානාලංකාර **දෙකක්** ලියා දක්වන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**3.** නිර්දේශිත රාග තුනක් හඳුනා ගැනීම සඳහා උපකාරී වන තොරතුරු දෙකක් පහත දැක්වේ.

(A) ශුද්ධ ස්වර පමණක් යෙදෙන නිර්දේශිත රාග දෙකකි.

(B) ස්‍රනිධපමගුරිස ලෙස අවරෝහණය යෙදෙන නිර්දේශිත රාගයකි.


(i) ඉහත (A) කොටසින් හා (B) කොටසින් පිළිබිඹු වන රාග **තුන** නම් කරන්න.

(ii) (A) කොටසට අයත් රාග දෙකින් **එක්** රාගයක ඛ්‍යාල් ගීතයෙහි හෝ ලක්ෂණ ගීතයෙහි හෝ වාදිතයෙහි හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) (B) කොටසට අයත් රාගයෙහි ආරෝහණ ස්වර ත්‍රිතාලයේ එක් ආවර්තයකට ගැළපෙන ලෙස තාලානුකූලව ප්‍රස්තාර කරන්න.

(iv) ජප් තාලය නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න.

**4.** පහත දැක්වෙනුයේ ගැමි ගී පිළිබඳ අසම්පූර්ණ ගැලීම් සටහනකි.




WWW.OLEVELAPI.COM

(i) ඉහත වගුවෙහි ඇති හිස්තැන්වලට අදාළ පිළිතුරු රෝම ඉලක්කම් ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ii) ආසාතාත්මක මෙහෙ ගීයක හා ආසාතාත්මක කෙළි ගීයක මුල් ගී පාදය බැගින් පද ප්‍රස්තාර කරන්න.

(iii) ඔබ ලියූ එම ගී පාද දෙකින් **එකකට** අයත් තිත නම් කර, එයට අදාළ බෙර පදය ප්‍රස්තාර කරන්න.

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**5.** පහත දැක්වෙනුයේ ශ්‍රී ලාංකේය රංග ශෛලීන් (සම්ප්‍රදායන්) කීපයකට අදාළ රූපසටහන් කිහිපයකි.



A



B



C



D

(i) **A, B, C, D** කොටස්වල ඇතුළත් රූප සටහන්වලින් පිළිබිඹු වන රංග ශෛලීන් පිළිවෙළින් නම් කරන්න.

(ii) **'A'** කොටසට අදාළ රංග ශෛලියෙහි ඇතුළත් ගීතයක මුල් ගී පාද **දෙක** ලියන්න.

(iii) **'B'** හා **'D'** යන කොටස් දෙකට අදාළ රංග ශෛලීන් දෙකෙහි සංගීතමය ලක්ෂණ **තුනක්** සංසන්දනය කර දක්වන්න.

(iv) **'C'** රූපසටහනට අදාළ ජවනිකාව ඇතුළත් නිර්මාණයේ නම ලියා එහි විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

**6.** පහත දැක්වෙනුයේ අපරදිග ස්වර ප්‍රස්තාර කොටසකි.



(i) ඉහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට හරවා තාලානුකූලව ස්වර ප්‍රස්තාර කරන්න.

(ii) ඉහත ස්වර ප්‍රස්තාරයට අදාළ අපරදිග ටයිම් සිග්නේචරය (Time Signature) ලියන්න.

(iii) එම ටයිම් සිග්නේචරයට ගැළපෙන හින්දුස්ථානි තාලයක් නම් කර එම තාලයෙහි ඨේකාව තාල සංකේත සමගින් ප්‍රස්තාර කරන්න.

(iv) quaver, minim, crochet, semi-breve යන අපරදිග ස්වර සංකේත හැඳින්වෙන රූප සටහන් ඇඳ ඒවාට අයත් මාත්‍රා සංඛ්‍යාවන් ද පිළිවෙළින් ලියා දක්වන්න.

**7.** (i) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** පිළිබඳ පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

- ග්‍රැමෆෝන් තැටි ගීත
- කපිරිඤ්ඤා ගීත

ලිපිය ලිවීමේ දී පහත දැක්වෙන ශීර්ෂ ද උපයෝගී කර ගන්න.

※ මෙරට ආරම්භය හා ව්‍යාප්තිය

※ ග්‍රැමෆෝන් ගී ගැයූ හෝ කපිරිඤ්ඤා ගීත ඇසුරින් නිර්මිත නව තනු ගැයූ ගායක/ගායිකාවන්

※ ගායනා කළ ගීත

※ සුවිශේෂී ලක්ෂණ

(ii) පහත සඳහන් ගී පාද දෙක සඳහා ශුද්ධ ස්වර ඇසුරින් දාදරා තාලයට අනුව තනුවක් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාරයක් ගොඩනගන්න.

- උඩු සුළඟේ පාව යන්න
  අනේ මගේ සරුංගලේ

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....